**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ( අතිරේක මූල්‍යකරණය) ව්‍යාපෘතිය - 2019**

**----------------------------------------------------------------------------------------------**

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ( අතිරේක මූල්‍ය කරණය) ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹි අංක 5768 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමෙහි 1 කොටසේ සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රධාන සඳහා වූ සාමාන්‍ය කොන්දේසිවල 4: 09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඌව පළාත්බද මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ දේශගුණික අවදානම කෙරෙහි නිරාවර්තිත ජනයා හා වත්කම් ගොදුරුවීම් සඳහා නතු වීමට ඇති ඉඩ අවකාශ අවම කිරීම හා ආපදාවන්ට සඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා වූ ධාරිතාවය වැඩි දියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 6,048 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 42 ක් වන අතර මුළු ණය ප්‍රමාණයම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ඔක්තෝබර් 15 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මතය

**------**

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යයසාධනය

## 2.1 ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල අනුව අතිරේක මූල්‍යකරණ අරමුණු සඳහා දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ආර්ථිකයක් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර දේශගුණික අවබලපෑම් අවමකිරීමට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ඊට අදාල උපකාරක සේවාවන් වැඩිදියුණු කිරීම් ලෙස ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රධාන සංරචක 2 කින් සමන්විත වී තිබුණි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිලිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|---|
| (අ) | රුපියල් මිලියන 6,048 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 42 ක් වෙන්කර ඇති අතර ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භයේ සිට මාස 39 ක් ගතවීමෙන් පසු ප්‍රතිපාදනවලින් සියයට 68.10 ක් නිරූපනය කරමින් රුපියල් මිලියන 4118.76 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 24.38 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම නිසා ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් ක්‍රියාත්මක නොකරන්නේ නම් ඉතිරි මාස 12 ක කාලය තුල සියයට 31.90 ක් නිරූපනය කරන රුපියල් මිලියන 1,929.24 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 17.62 ක ඉතිරි මුදල භාවිතා කිරීමේ හැකියාව ප්‍රශ්න සහගත විය. කොන්ත්‍රාත් නිම කිරීම සහ කොන්ත්‍රාත් බිල්පත් ඇගයීම ප්‍රමාදවීම මූල්‍ය ප්‍රගතිය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. | ව්‍යාපෘතියේ භෞතික ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවීම. | අදහස් දක්වා නැත. | අනාගත ව්‍යාපෘතීන් වලදී ප්‍රමාදයන් සිදුවීම වලක්වා ගැනීමට හැකිවන ලෙස මෙම ප්‍රමාදයන් පිලිබඳ අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම. |
| (ආ) | සපයන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 2,984.2 ක්වූ කොන්ත්‍රාත් පැකේජ් 80 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ව්‍යාපෘතියේ භෞතික ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවීම. | හඳුනාගත් කොන්ත්‍රාත් පැකේජ 82 ක් අරමුදල් ලබාගැනීමේ හැකියාව මත පදනම්ව ව්‍යාපෘතිය ආරම්භයේදීම පැකේජ 68 ක් ප්‍රදානය කරන ලදි. | අනාගත ව්‍යාපෘතීන්වලදී ප්‍රමාදයන් සිදුවීම වලක්වා ගැනීමට හැකිවන ලෙස මෙම ප්‍රමාදයන් |

| | | | | |
|---|---|---|---|---|
| | විසින් ප්‍රදානය කර තිබුණු අතර ඉන් පැකේජ 45 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණි. කොන්ත්‍රාත් පැකේජ් 35 ක් කොන්ත්‍රාත් කාල සීමාව තුළ නිමකර නොතිබූ අතර වටිනාකම රු.මිලියන 1,578.1 ක්වූ මෙම කොන්ත්‍රාත් පැකේජවල ප්‍රමාද වී පැමිණි කාලය මාස 1 සිට මාස 18 දක්වා විය. | | දෙවන අර්ධ වර්ෂයේ ශ්‍රී ලංකා රුපියලට එරෙහිව ඇමරිකානු ඩොලර් අගය වැඩිවීම හේතුවෙන් ඉතිරි පැකේජ 14 ප්‍රදානය කිරීමට ඇත. යල හා මහ කන්නයන්ට ජලය නිකුත් කිරීම වෙනුවෙන් මෙම කොන්ත්‍රාත් ආරම්භ කරන ලදි. එබැවින් කොන්ත්‍රාත්කරුවන්ට සීමිත කාලයක් දී ඇත. මේ වනවිට, මෙම කොන්ත්‍රාත්වලින් වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇත. | පිලිබඳ අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම. |
| (ඇ) | ඉදිරිපත් වූ තොරතුරු අනුව වටිනාකම රු.මිලියන 1,061.59 ක්වූ කොන්ත්‍රාත් පැකේජ 27 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ප්‍රදානය කර තිබුණි. වටිනාකම රු.මිලියන 670.1 ක්වූ කොන්ත්‍රාත් පැකේජ 15 ක් 2019 දෙසැම්බර් 31 වන විටත් නිම නොකර පැවතුණි. තවද කොන්ත්‍රාත් වැඩ අවසන් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් රුපියල් මිලියන 138.2 ක කොන්ත්‍රාත් පැකේජ 2 ක් අත්හැර දමා තිබුණි. | ව්‍යාපෘතියේ භෞතික ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවීම. | කොන්ත්‍රාත් පැකේජ 14 ක් සම්පූර්ණ නොකර ඉතිරි වී තිබුණි. කොන්ත්‍රාත් පැකේජ 14 න් කොන්ත්‍රාත් පැකේජ 6 ක් කොන්ත්‍රාත් කාලය තුළ සම්පූර්ණ කරන ලදි. කොන්ත්‍රාත් පැකේජ 8 ක් සම්පූර්ණ කිරීම ප්‍රමාද වී ඇත. බොහොමයක් ප්‍රධාන හා අතු ඇළවල් පුනුරුත්ථාපනය කිරීම විය. මාර්තු හා අප්‍රේල්, අගෝස්තු හා සැප්තැම්බර් මාස වල ජලය නතර කර ඇත. කාලසීමාව තුල පමණක් මෙම කටයුතු සිදු කළ හැකිය. ජලය නතර කර ඇති කාලසීමාව තුල අවම වශයෙන් මසකට වරක්වත් පානීය ජල අවශ්‍යතා සඳහා ජලය නිකුත්කල යුතු අතර එමඟින් කොන්ත්‍රාත් කාර්යයන් වලට බාධා ඇතිවේ. මීට අමතරව පස් සඳහා බලපත්‍ර ලබාගැනීමට ද සිදුවීම මෙම වැඩ | අනාගත ව්‍යාපෘතීන් වලදී ප්‍රමාදයන් සිදුවීම වලක්වා ගැනීමට හැකිවන ලෙස මෙම ප්‍රමාදයන් පිලිබඳ අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නියමිත වේලාවට අවසන් කිරීම ප්‍රමාද වීමට එක් හේතුවකි. මෙම සියලුම පැකේජ 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කරනු ලැබේ. රුපියල් මිලියන 111.3 ක් වටිනා කොන්ත්‍රාත් 2 ක් අවලංගු කර ඇත. C කලාපයේ ප්‍රධාන ඇළ මාර්ගයේ ජල ගැටලු අඛණ්ඩව පැවතීම සහ ප්‍රාදේශයේ සුදුසු ද්‍රව්‍ය නොවීම හේතුවෙන් වැඩ කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා නිසා එක් කොන්ත්‍රාත්තුවක් අවලංගු කරන ලදි. එබැවින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මෙම කොන්ත්‍රාත්තුව වෙනත් ඕනෑම මුදල් ප්‍රභවයකින් පසු කාලීනව සිදු කරනු ඇතැයි උපකල්පනය කර අවලංගු කර ඇත. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ L කලාපයේ දුර්වල ප්‍රගතිය හේතුවෙන් දෙවන කොන්ත්‍රාත් පැකේජය අවලංගු කරන ලදි. මේවන විට 75 % වැඩ අවසන් කර ඇති අතර 2020 ට පෙර වැඩ නිම කිරීමට බලාපොරොත්තු වේ. | |
| (ඇ) | වටිනාකම රුපියල් මිලියන 1,655 ක් වූ කොන්ත්‍රාත් පැකේජ 11 ක් ප්‍රදානය කර තිබුණු අතර ඉන් වටිනාකම රුපියල් මිලියන 465.4 ක් වූ කොන්ත්‍රාත් පැකේජ 5 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කර ඇත. කෙසේවෙතත් කොන්ත්‍රාත්කරුවන්ගේ අසමත්වීම් හේතුවෙන් රුපියල් | ව්‍යාපෘතියේ භෞතික ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවීම. | විගණන නිරීක්ෂණය නිවැරදිය. කොන්ත්‍රාත් පැකේජ 11 න් 8 ක් නිම කර යාවත්කාලීන කර ඇත. කරගෙන යමින් පවතින අනෙකුත් කොන්ත්‍රාත් පැකේජවල ප්‍රගතිය සියයට 90 කට වඩා වැඩිය. මේ දක්වා මූළු මූල්‍ය ප්‍රගතිය රු. | අනාගත ව්‍යාපෘතීන් වලදී ප්‍රමාදයන් සිදුවීම වලක්වා ගැනීමට හැකිවන ලෙස මෙම ප්‍රමාදයන් පිලිබඳ අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම. |

| | | | |
|---|---|---|---|
| මිලියන 1,190.15 ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 6 ක් කොන්ත්‍රාත් කාලය තුළ නිමකළ නොහැකි වී තිබුණි. | | 1,384,836,937 කි. ඉහත සඳහන් සියලුම කොන්ත්‍රාත් පැකේජ 2020 දෙසැම්බර් 31 ට පෙර නිම කළ හැකිය.(ගෙවීම්ද ඇතුළත්ව) | |

## 2.2 වැඩබිම් පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) කොන්ත්‍රාත්කරුවන් විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවට වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් පැකේජ 8 න් 7 ක්ම කොන්ත්‍රාත්කරුවන් විසින් සම්පූර්ණ කර තිබුණි. වැඩබිමෙහි ස්ථානීය පරීක්ෂාවේදී ඇස්තමේන්තුගත පිරිවැය අනුව රු.6,498,664 ක්වූ ප්‍රමාණ බිල්පතෙහි දක්වා ඇති වැඩ සිදුකර නොතිබුණු අතර එනම් අවශ්‍ය ස්ථානවල ඇල දෙපස පස් පිරිවීම සහ තෘණ පැල සඳහා ජලය යෙදීම වැනි කොන්ත්‍රාත්කරුවන් විසින් නිශ්චිතව දක්වා ඇති වැඩකටයුතු අවසන් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | කාර්යය නිසියාකාරව නිමකිරීමට නොහැකි විය හැකිය. | සුදුසු ද්‍රව්‍ය සොයා ගැනීමට හා අදාල බලධාරීන්ගේ අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ක්ෂෙත්‍රයේ ඇති දැඩි දුෂ්කරතා හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට මෙම උප අයිතමය නිම කිරීමට නොහැකි විය. පාර්ලිමේන්තුව ඇතුලුව රැස්වීම් කීපයකදී මෙම ප්‍රශ්නය සාකච්ඡා විය. සම්පූර්ණ වැඩ කටයුතු 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. | කොන්ත්‍රාත්කරුවන්ට ඉක්මනින් වැඩ නිම කිරීමට උපදෙස් දිය යුතුය. |
| (ආ) හසලක ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු ප්‍රදේශයේ ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීම සඳහා රුපියල් මිලියන 471.89 ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 8 ක් ප්‍රදානය කර ඇති බවත්, 2019 පෙබරවාරි මාසය වන විට එය නිමකිරීමට සැලසුම් කර ඇති බවත් විගණන පරීක්ෂණයේ දී | කාර්යය නිසියාකාරව නිමකිරීමට නොහැකි විය හැකිය. | මිනිපේ ප්‍රධාන ඇල කිලෝමීටර් 74 ක් දිග වන අතර ජලය නිකුත් කිරීම අදියර වශයෙන් බෙදා ඇත. අදියර III හා IV ජලය නිකුත් කිරීම අදියර II හා IV ජලය නිකුත් කිරීමට මසකට පෙර ආරම්භ | කාර්යසාධන ඇපකරයේ වලංගු කාලය දීර්ඝ කිරීම සඳහා අර්ථවත් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | නිරීක්ෂණය විය. කෙසේවෙතත්, රුපියල් මිලියන 380.46 ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 6 ක් 2020 ජූලි දක්වාම අවසන් කර නොතිබුණි. තවදුරටත් කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්යසාධන ඇපකරය වලංගු කාලය දීර්ඝ කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. පිරිවැය රු.6,498,664 ක් වූ කොන්ත්‍රාත් කොන්ත්‍රාත්කරුවන් විසින් සිදුකර නොතිබුණි. | | වේ. එබැවින්, අදියර II හා III වැඩ කටයුතු ආරම්භ කිරීම ජලය නිකුත් නොකරන කාලය ඉතාම අඩු කාලසීමාවක් වේ. යල සහ මහ කන්නයට ජලය ලබා දීමට මෙම කොන්ත්‍රාත් ආරම්භ කර ඇත. එබැවින් කොන්ත්‍රාත්කරුවන්ට ඇත්තේ සීමිත කාලසීමාවක් වේ. මේ වන විට කොන්ත්‍රාත් 3 ක් අවසන් කර ඇත. ඉතිරි පැකේජ 4 2020 දෙසැම්බර් 31 දිනවන විට අවසන් වේ. | |
| (ඇ) | වටිනාකම රු.මිලියන 58.82 ක් වූ සෙල්ලකතරගම - කිරිවෙහෙර මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රමාණ පත්‍රයේ සඳහන් පරිදි ඝණත්වය සහිතව කොන්ක්‍රීට් යොදා නොතිබීම හේතුවෙන් රුපියල් 1,797,120 ක අලාභයක් සිදුවී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත ප්‍රමිතියට අනුකූලව මෙම මාර්ගය ඉදිනොකිරීම හේතුවෙන් මාර්ගයේ කල් පැවැත්ම හා ගුණාත්මකභාවය ප්‍රශ්න සහගත විය. | කාර්යය නිසියාකාරව නිමකිරීමට නොහැකි විය හැකිය. | ව්‍යාපෘතිය විසින් මේ වනවිට කොන්ත්‍රාත්කරුට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පමණක් ගෙවා ඇති බැවින් මේවන විට මෙතරම් අලාභයක් සිදු වී ඇති බව පැවසීම දුෂ්කර වේ. විගණන වාර්තාව මඟින් පෙන්වා දී ඇති පරිදි ඌව පලාතේ ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් පෙන්වා දී ඇත්තේ පදික වේදිකාවේ දැනට පවතින තාර තට්ටුව ඉවත් කිරීම නිසා Shoulder කොන්ක්‍රීට් තට්ටුවේ ගැඹුර මිලිමීටර් 150 ක ඝණත්වයකින් පවත්වා ගැනීම අපහසු බවය. ( ගොඩනැඟීමේ මට්ටම තාර තට්ටුවේ ඉහලට පවත්වා ගත යුතුය.) නමුත් Shoulder අනෙක් කෙලවරේ | කොන්ත්‍රාත්කරුවන්ට ක්‍රමවත්ව වැඩ නිම කිරීමට උපදෙස් ලබා දිය යුතුය . |

සණත්වය මිලිමීටර් 150 ක සණත්වය නිසිලෙස නඩත්තු කෙරේ. බිල් කිරීමේ කාර්යය සඳහා කොන්ක්‍රීට් තට්ටුවේ සත්‍ය ගැඹුර මැදින් කැපීම මඟින් සත්‍යාපනය කරගන්නා අතර ඒ අනුව කරන ලද සත්‍ය වැඩ ප්‍රමාණයට ගෙවනු ලබයි. ගෝනි හෝ වෙනත් සුදුසු ද්‍රව්‍ය භාවිතා කරමින් කොන්ක්‍රීට් ඇතිරීමෙන් බලාපොරොත්තු වන්නේ ශක්තිමත්ව කොන්ක්‍රීට් අතුරා ගැනීමයි. එබැවින් එලෙසම කොන්ක්‍රීට් අතුරා අවධානය වෙනතකට යොමු නොවන පරීක්ෂණ ක්‍රමයක් මඟින් පරීක්ෂා කරන අතර නිශ්චිතව ශක්තිය ලැබී ඇද්ද යන්න තහවුරු කරගනු ලැබේ. යකඩ කම්බි අතර පරතරය යම් ස්ථානයක වෙනස්වීම හේතුවෙන් දැලේ පිහිටීම සහ කම්බිවල ශක්තිමත් කම අයෝග්‍ය වේ. නමුත් වානේ කම්බිවල සත්‍ය ප්‍රමාණයම ඒ සඳහා භාවිතා කරන ලදි.